# GMOA

ESTABLISHED IN 1926
TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk


2013/10/07

## මාධ්‍ය නිවේදනයයි

ආහාර සුරක්ෂිතතාවය පිලිබඳ දස වැදැරුම් යෝජනාවලියක් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් පිලියෙල කොට පසුගිය අගෝස්තු මාසයේදි සෞඛ්‍ය අමාත්‍යවරයාට භාරදෙන ලදි. මෙම යෝජනාවලියේ අඩංගු කරුණු සඳහා කැබිනට් අනුමැතිය පසුගිය සැප්තැම්බර් මාසයේදි ලැබී ඇත. මේ බොහෝ යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය වෙනත් අමාත්‍යාංශ සමග ඒකාබද්ධව ක්‍රියාත්මක විය යුතුය.

මව්කිරි ප්‍රවර්ධනය පිලිබඳ යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු දැනටමත් ආරම්භ වී තිබේ. "Breast Feeding Sri Lanka " වෙබ් අඩවිය පවුල් සෞඛ්‍ය කාර්‍යාංශය හා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය ඒකාබද්ධව දැනටමත් සකස් කරමින් පවතී.

උපතේ සිට පලමු වසර සම්පූර්ණ වන තෙක් ළදරුවන් සඳහා සමාගම් විසින් නිෂ්පාදනය කරන ආහාර පිලිබඳ වෙළඳ ප්‍රචාරනය දැනටමත් නීතියෙන් තහනම්ය. මෙම නීතිය තවත් ශක්තිමත් කොට උපතේ සිට අවුරුදු අවුරුදු 02 දක්වා දරුවන් සඳහා ඇති ආහාර නිෂ්පාදන පිලිබඳ වෙළඳ ප්‍රචාරනය තහනම් කරවීමට නීති ප්‍රතිපාදන සංශෝධනය කරවීම සඳහා අදාල බලධාරීන්ට අප බල කර සිටිමු.

මේ සියලු කරුණු කාරණා පිලිබඳ සාකච්ඡා කිරීමටත්, දස වැදෑරුම් යෝජනාවලිය ක්‍රියාත්මකවීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීමටත් මෙම මස 10 වන බ්‍රහස්පතින්දා සෞඛ්‍ය ලේකම්වරයා සමග රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය තිරණාත්මක සාකච්ඡාවක් පැවැත්වීමට නියමිතය.

ස්තුතියි

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

වැඩිදුර විස්තර -

වෛද්‍ය නවීන් සොයිසා - 0718582444
වෛද්‍ය නලින්ද හේරත් - 0717876516